# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 11,663—1959 පෙබරවාරි 10 වැනි අඟහරුවාද—10.2.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**අංකය : ඇෆ්සී/වී.—ඇස්.ඇෆ්. 7 (3)**

හරක් මස්.

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි ඡේදය හා 3 (2) වෙනි ඡෙදයෙන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(i) 1958 අගෝස්තු මස 20 වැනි දිනය හා 11,478 වැනි අංකය දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1958 අගෝස්තු මස 20 වැනි දිනය හා එෆ්සී/වී—ඇස්ඇෆ්. 7 (2) වැනි අංකය දරණ ආහාර මිල නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උපලේඛනයේ 2, 3 සහ 4වෙනි තීරයන්හි සඳහන් මිළ මෙරට හරක්මස් රාත්තලක වැඩිම මිළ වශයෙන් වහාම ක්‍රියාත්මක වනසේ නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට හා ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් එම උපලේඛනයේම 1 වෙනි තීරයේ සඳහන් කොට ඇති සීමාවන් ඇතුළත එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද මෙම නියෝගයේ කාය්‍ර්‍යය සඳහා—

(අ) '' මෙරට හරක්මස් '' යනුවෙන් හැඟවෙන්නේ ඇතිකරන ඉන්දියානු හෝ සිංහල ගවයන්ගේ හෝ මීහරකුන්ගේ මාංශයයි. බොකු, බඩවැල් ආදි සියලු ආකාර ඉවත්කරනු ලබන දෑය මීට ඇතුළත් නොවේ;

(ආ) සතෙකුගේ සිරුර විකිණීම සඳහා මස් මඩුවේ පිලියෙල කොට ඇති පරිදි (එනම් : හිස, හම, බොකු, බඩවැල්, කුර සහ වෙනත් සියලු විධියේ සාමාන්‍යයෙන් ඉවත්කරනු ලබන දෑය අතහැර) විකුණන විට '' තනිබර අනුව '' විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) කටු සහිත මෙරට හරක්මස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25කට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(v) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් ඇති සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ, පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(vi) '' මෙරට හරක්මස් '' විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා එලිදරව්වේ තැබිය යුත්තේ ඒ සඳහා වෙන්කොට ඇති වෙළඳ පිල්වල පමණකි. එම වෙළඳ පිල්වල වෙනත් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා එලිදරව්වේ තැබීම නොකළ යුතුයි.

(vii) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ කිසියම් තැනක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උප ලේඛනයේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් '' මෙරට හරක්මස් '' ඇති සෑම වෙළෙන්දෙකුම එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් මෙරට හරක්මස් පමණක් විකුණන බවට එම මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිලිව පෙනෙන සේ දැන්වීමක් තැබිය යුතුයි.

(viii) ඉවත්කරනු ලබන දෑය සමග මෙරට හරක්මස් එකම ගණුදෙනුවකදී විකුණනු ලබන විට මෙරට හරක්මස් ඉවත්කරනු ලබන දෑයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(ix) සෑම වෙළෙන්දෙකුම මෙරට හරක්මස් විකුණන කල්හි, මෙරට හරක්මස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලාගැනීමට හැකිවනසේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(x) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් මෙරට හරක්මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, මෙරට හරක්මස් ලබාගන්නකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ මෙරට හරක්මස් ප්‍රමාණය (බර) ;
(ඇ) විකුණූ මෙරට හරක්මස්වල විස්තරය ; සහ
(ඈ) විකුණූ මෙරට හරක්මස් ප්‍රමාණයට ගෙවූ මුදලද
සඳහන් විය යුතුයි.

(xi) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරන ලද සෑම ප්‍රදේශයක් තුළ, කිසිවකු උපලේඛනයේ සඳහන් දුය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කලවම් කොට නොවිකිණිය යුතුයි.

(xii) උපලේඛනයේ සඳහන් දුය විකුණන කල්හී, එකී දුය ඔතා හෝ බහාලන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයේ 2, 3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(xiii) මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1959 පෙබරවාරි 9 වෙනි දින පෙ. ව. 11.20ට කොළඹ කච්චේරියේදී අත්සන් කරන ලදී.

එස්. ජේ. විජේසේකර,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

### මෙරට හරක්මස් සඳහා වැඩිම මිළ

| | 1 වෙනි තීරය | 2වෙනි තීරය | 3වෙනි තීරය | 4වෙනි තීරය |
|---|---|---|---|---|
| | ප්‍රදේශය | මෙරට හරක්මස් කටු රහිත රාත්තලක වැඩිම මිළ | මෙරට හරක්මස් කටු සහිත රාත්තලක වැඩිම මිළ | මෙරට හරක්මස් තනිබර අනුව රාත්තලක වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1. | දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභාවේ සීමාව ඇතුළතද, කෝට්ටේ පළාත් ආණ්ඩු සභාවේ සීමාව ඇතුලතද සහ අතුරුගිරිය ගම්කාර්‍ය්‍ය සභා සීමාව ඇතුළතද ... | 0 95 ... | 0 80 ... | 0 70 |
| 2. | මොරටුවේ පළාත් ආණ්ඩු සභා සීමාව ඇතුළතද, පිලියන්දල සුළු නගර සභා සීමාව ඇතුළත සහ වේයන්ගොඩ සුළු නගර සභා සීමාව ඇතුළත ... ... | 0 90 ... | 0 75 ... | 0 65 |
| 3. | වත්තල-හැඳල ගම්කාර්‍ය්‍ය සභා සීමාව ඇතුළතද, කණුවන ගම්කාර්‍ය්‍ය සභා සීමාව ඇතුළත සහ අවිස්සාවේල්ලේ පළාත් ආණ්ඩු සභා සීමාව ඇතුළත ... ... | 0 85 ... | 0 70 ... | 0 60 |
| 4. | මිණුවන්ගොඩ සුළු නගර සභා සීමාව ඇතුළත ... ... ... | 0 85 ... | 0 75 ... | 0 60 |
| 5. | කොළඹ දිස්ත්‍රික්කයේ (කොළඹ නාගරික සීමාව, දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාව, කෝට්ටේ පළාත් ආණ්ඩු සභා සීමාව, අතුරුගිරිය ගම්කාර්‍ය්‍ය සභා, මොරටුවේ පළාත් ආණ්ඩු සභා, පිලියන්දල සුළු නගර සභා, වේයන්ගොඩ සුළු නගර සභා, වත්තල-හැඳල ගම්කාර්‍ය්‍ය සභා, කණුවන ගම්කාර්‍ය්‍ය සභා, අවිස්සාවෙල්ලේ පළාත් ආණ්ඩු සභාවේ සහ මිණුවන්ගොඩ සුළු නගර සභා සීමාවන් හැර) ... | 0 80 ... | 0 65 ... | 0 55 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළ වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**අංක එෆ්.සී./වී.—එස්.එෆ්. 3(4) දරන මිළ නියෝගය.** **එළුමස්.**

### 1950 අංක 29 දරන මිළ පාලන පනත

#### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4වෙනි ඡෙදය හා 3(2) ඡෙදයෙන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(i) 1958 ජූලි මස 5වෙනි දිනය හා 11,469 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරනලද 1958 ජූලි මස 5වෙනි දිනය හා එෆ්.සී./වී.—එස්. එෆ්. (3)3 වෙනි අංකය දරන ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උපලේඛනයේ 2,3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් මිළ, එළුමස් රාත්තලක වැඩිම මිළ වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස්, එම උප ලේඛනයේම 1 වෙනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශ තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) ''එළුමස්'' යනුවෙන් හැඟවෙන්නේ බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ මාංශයයි. බොකු, බඩවැල් ආදි සියළු ආකාර ඉවත් කරනු ලබන දුය මීට ඇතුළත් නොවේ ;

(ආ) බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ සිරුර විකිණීම සඳහා මස්මඩුවේ පිළියෙල කොට ඇති පරිදි (එනම් : හිස, හම, බොකු බඩවැල්, කුර සහ වෙනත් සියළු විධියේ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන දුය අතහැර) විකුණන විට ''තනි බර අනුව'' විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) කටු සහිත එළුමස් විකුණන කල්හී විකුණන මුළු බරින් සියයට 25කට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(v) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසිම තැනක, වාහනයක හෝ යාත්‍රාවක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ, උපලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත් වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(vi) ඉවත් කරනු ලබන දුය සමග එළුමස් එනම්, ගණුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස්, ඉවත් කරනු ලබන දුයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(vii) සෑම වෙළෙන්දෙකුම එළුමස් විකුණන කල්හී, එළුමස් ලබාගන්නාට සැබෑබර පහසුවෙන් බලාගැනීමට හැකි වනසේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(viii) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් විකුණන සෑම වෙළෙන්දෙකුම, එළුමස් ලබාගන්නකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ එළුමස් ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ එළුමස්වල විස්තරය ; සහ

(ඇ) විකුණූ එළුමස් ප්‍රමාණයට ගෙවූ මුදල ;

සඳහන් විය යුතුයි.

(ix) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනලද සෑම ප්‍රදේශයක් තුළ, කිසිවෙකු උපලේඛනයේ සඳහන් දෑය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කලවම් කොට නොවිකිණිය යුතුයි.

(x) උපලේඛනයෙහි සඳහන් දෑය විකුණන කල්හී, එකී දෑය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයෙහි 2, 3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(xi) මෙම නියෝගයෙහි කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1959 පෙබරවාරි 9 වෙනි දින පෙ.ව. 11.20ට කොළඹ කච්චේරියේදී අත්සන් කරන ලදී.

එස්. ජේ. විජේසේකර,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලෙඛනය

### මෙරට එළුමස් සඳහා වැඩිම මිළ

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| (1) පිලියන්දල සුළු නගර සහා සීමාව ඇතුළත ... ... ... | 2 0 ... | 1 75 ... | 1 50 |
| (2) හැඳල-වත්තල ගම්කාර්‍ය සහා සීමාව ඇතුළත ... ... ... | 2 25 ... | 2 0 ... | 1 70 |
| (3) වේයන්ගොඩ සුළු නගර සහා සීමාව ඇතුළත ... ... ... | 2 50 ... | 2 0 ... | 1 70 |
| (4) කණුවන ගම්කාර්‍ය සහා සීමාව තුළ ... ... ... | 2 25 ... | 2 0 ... | 1 70 |
| (5) අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සහා සීමාව ඇතුළත ... ... | 2 50 ... | 2 15 ... | 1 70 |
| (6) අතුරුගිරිය ගම්කාර්‍ය සහා සීමාව ඇතුළත ... ... ... | 2 25 ... | 1 95 ... | 1 70 |
| (7) මිණුවන්ගොඩ සුළු නගර සහා සීමාව ඇතුළත ... ... ... | 2 25 ... | 2 0 ... | 1 70 |
| (8) කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික සහා සීමාව සහ පිලියන්දල සුළු නගර සහා, හැඳල වත්තල ගම්කාර්‍ය සහා, වේයන්ගොඩ සුළු නගර සහා, කණුවන ගම් කාර්‍ය සහා, අවිස්සාවෙල්ල පළාත් ආණ්ඩු සහා, අතුරුගිරිය ගම්කාර්‍ය සහා සහ මිණුවන් ගොඩ සුළු නගර සහා සීමාවන් හැර) ... ... ... | 2 15 ... | 1 85 ... | 1 60 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුය.

---

**අංක : එෆ්.සී./වී—එස්.එෆ්. 1 (20)** අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි ඡෙදය හා 3 (2) වෙනි ඡෙදයන්ද මා කෙරෙහි පවරා ඇති බලතල අනුව—

(i) 1958 අගෝස්තු 20 වෙනි දින අංක 11,478 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද 1958 අගෝස්තු 20 වෙනි දින අංක එෆ්. සී./වී—එස්.එෆ්. 1(16) දරණ ආහාර මිළ නියෝගයේ ''ඒ'' සහ ''බී'' උපලේඛනයන්හි 12 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයන්හි තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මේ උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන්, මේ උපලේඛනයේ 3වෙනි සහ 4වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,
(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;
(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(v) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(vi) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි ;

(vii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ සඳහන් උම්බලකඩ සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්;—

(අ) විකුණූ දිනය ;
(ආ) උම්බලකඩ විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(viii) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහාලන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 3 වෙනි සහ 4වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වී ඇති බවද නියම කරමි.

1959 පෙබරවාරි මස 9 වෙනි දින පෙ.ව. 11.20ට කොළඹ කච්චේරියේදී අත්සන් කරන ලදී.

එස්. ජේ. විජේසේකර,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

උපලේඛනය

| 1 වැනි තීරය විස්තරය | 2 වැනි තීරය ප්‍රදේශය | 3 වැනි තීරය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | 4 වැනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
|---|---|---|---|
| උම්බලකඩ (සියළුම වර්ගවල්) | (1) හාපිටිගම් කෝරළේ | 248 27 | 2 41 |
| | (2) අළුත්කුරු කෝරළේ උතුර "ඒ" | 248 01 | 2 41 |
| | (3) උතුරු අළුත්කුරු කෝරළේ "බී" | 247 95 | 2 41 |
| | (4) දකුණු අළුත්කුරු කෝරළේ | 247 75 | 2 41 |
| | (5) නැගෙනහිර සියනෑ කෝරළේ | 248 01 | 2 41 |
| | (6) බටහිර සියනෑ කෝරළේ (අධිකාරි පත්තුව) | 247 67 | 2 41 |
| | (7) බටහිර සියනෑ කෝරළේ (මැද පත්තු) | 247 77 | 2 41 |
| | (8) හේවාගම් කෝරළේ | 247 85 | 2 41 |
| | (9) සල්පිටි කෝරළේ | 247 77 | 2 41 |
| | (10) කොළඹ ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාව හැර) | 247 69 | 2 40 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ . මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

54 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.

අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)

## 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත

### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 3 (2) වගන්තිය හා කියවෙන අංක 29 දරණ මිළ පාලක පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1958 සැප්තැම්බර් 2 වැනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1958 අගෝස්තු 26 වන දින අංක 50 දරණ ආහාර මිළ නියෝගයේ උපලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලෙඛනයෙහි 2 සිට 7 දක්වා ඇති තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර මිළ ද මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වැනි දින සිට අවලංගු කරමි.

(ii) මීට යා කර ඇති උපලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද හම්බන්තොට පරිපාලක දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ 1959 පෙබරවාරි 1 වැනි දින සිට මේ උපලෙඛනයේ 2 සිට 7 දක්වා තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) එසේම හම්බන්තොට පරිපාලක දිස්ත්‍රික්කය ඇතුළත උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නො විකිණිය යුතු බව නියම කරමි.

(v) තවද හම්බන්තොට පරිපාලක දිස්ත්‍රික්කය ඇතුළත යම් ස්ථානයක හෝ වාහනයක උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(vi) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(vii) එසේම හම්බන්තොට පරිපාලක දිස්ත්‍රික්කය ඇතුළත උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන් ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(viii) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලෙඛනයේ 2 සිට 7 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වී ඇති බවද නියම කරමි.

1959 පෙබරවාරි මස 7 වෙනි දින පෙරවරු 11.30ට හම්බන්තොට දී අත්සන් කරන ලදී.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන. පාලක දිස්ත්‍රික්කය
හම්බන්තොට.

උපලේඛනය

| 1 වැනි තීරය | ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ: 2 වැනි තීරය බෙලිඅත්ත, තංගල්ල, දෙද්දුවාවල මහවෙල | 3 වැනි තීරය හම්බන්තොට, අම්බලන්තොට, වලස්මුල්ල, රන්න, වීරකැටිය | 4 වැනි තීරය තිස්ස | 5 වැනි තීරය කටුවන, කිරම, මිද්දෙනිය | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ: 6 වැනි තීරය බටහිර ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 7 වැනි තීරය මාගම් පත්තුවේ සහ නැගෙනහිර ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය |
|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ | ... 244 86 | ... 245 21 | ... 245 51 | ... 245 36 | ... 2 44 | ... 2 45 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකිය.

---

**කේර්. 48 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.**

අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)

**1950හේ අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

කැගලු දිසාවේ උප (ආහාර) මිළ පාලක තැන්පත් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958වේ සැප්තැම්බර් මස 2 වැනි දින අංක 11,511 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1958වේ අගෝස්තු 27 වැනි දින අංක කේර්. 40 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලෙඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල පිළිවෙලින් දක්වෙන තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් 1959යේ පෙබරවාරි මස 1 වැනි දින සිට මෙයින් අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක් ද, කැගල්ල දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ 1959යේ පෙබරවාරි මස 1 වැනි දින සිට මේ උපලෙඛනයේ 2 වැනි සහ 3 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත්,

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම කැගලු දිසාවේ සීමාවන් ඇතුළත උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නො විකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, කැගලු දිසාවේ සීමාවන් ඇතුළත යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම, කැගලු දිසාවේ සීමාවන් ඇතුළත උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් ම මිළයට ගන්නා ඉල්លුවහොත් පහත සඳහන් විස්තර, එනම් ;—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලෙඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වී ඇති බවද නියම කරමි.

වර්ෂ 1959යේ ජනවාරි මස 31 වැනි දින පෙරවරු 11ට කැගල්ලේදී අත්සන් කරන ලදී.

නාගමුත්තු පුලේන්දිරන්,
කැගලු දිසාවේ උප (ආහාර) මිළ පාලක තැන.

උපලෙඛනය

| 1 වැනි තීරය විස්තර | 2 වැනි තීරය තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ (සියලුම වර්ගවල) ... ... ... | 242 25 | ... 2 42 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතුයි.

ආහාර මිළ නියෝගය අංක : ඇන්/ඊ 44. අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ).

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ආතර් කත්බට් බතෝලමියුස් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වැනි වගන්තියෙන් මා හට පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් 15 වැනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 සැප්තැම්බර් 10 වැනි දින දරණ අංක ඇන්/ඊ 39 දරණ ආහාර මිළ නියෝගයේ '' ඒ '' සහ '' බී '' උපලේඛනයන්හි 12 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි වැඩිම මිළද මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වැනි දින පටන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති '' ඒ '' සහ '' බී '' උපලේඛනයන්හි 3 වෙනි තීරයේ මිළ ගණන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක්ද උපලේඛනයෙහි 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත උම්බලකඩ විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම් සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල්කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම මෙම නියෝගයේ '' ඒ '' සහ '' බී '' උපලේඛනයන්හි 3 වෙනි තීරයේ සඳහන් වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක්, උම්බලකඩ යම් ස්ථානයක හෝ වාහනයක සිය ස්වාමිත්වය යටතේ හෝ පාලනය යටතේ හෝ ඇත්තේ නම් එවැනි සෑම වෙළෙන්දෙක්ම එකී වාහනයේ හෝ ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම, උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) '' ඒ '' සහ '' බී '' උපලේඛනයන්හි 3 වෙනි තීරයන්හි සඳහන් වී ඇති වැඩිම මිළ ගණන් වලට උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් ඇතුළත් වී ඇති බවද නියම කරමි.

(9) මෙම නියෝගය උඩහේවාහැට ආදායම් නිලධාරි කොට්ඨාශයේ බලපවත්වන්නේ නැත.

1959 පෙබරවාරි 1 වෙනි දින පෙරවරු 11ට නුවරඑළියේ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඒ. සී. බතෝලමියුස්,
උප මිළ පාලක තැන (ආහාර) නුවරඑළිය දිස්ත්‍රික්කය.

### උප ලේඛනය '' ඒ ''

තොග වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ.

| 1 තීරය<br>ප්‍රදේශය | 2 තීරය<br>විස්තරය | 3 තීරය<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ දී තොග වෙළෙන්දෙකුගේ වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. නුවරඑළිය නාගරික සභා ප්‍රදේශය<br>2. කඳපොල<br>3. නානුඔය<br>4. රම්බොඩ වටුම<br>5. සංගිලි පාලම<br>6. කුඩාඔය<br>7. පුන්ඩළුඔය<br>8. තිස්පනේ කෝරළේ<br>9. පල්ලෙපනේ කෝරළේ<br>10. මොරපේ<br>11. විලිකුල්ට්ටි<br>12. ඩයගම<br>13. ආගරපතන<br>14. මැදපනේ ගම්සභා ප්‍රදේශය | උම්බලකඩ ... | 251 72 |
| 15. රාගල<br>16. උඩපුස්සැල්ලාව | උම්බලකඩ ... | 252 82 |

| 1 තීරය<br>ප්‍රදෙශය | 2 තීරය<br>විස්තරය | 3 තීරය<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ දී තොගවෙළෙන්දෙකුගේ වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 17. නිල්දණ්ඩාහින්න<br>18. හරස්බැද්ද<br>19. වතුමුල්ල<br>20. කුඹල්ගමුව | උම්බලකඩ ... | 256 48 |
| 21. දිඹුල<br>22. වටගොඩ<br>23. තලවකැලේ<br>24. ලිඳුල<br>25. වලහා<br>26. කොටගල | උම්බලකඩ ... | 248 79 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතුයි.

## උපලේඛනය "බී"

**සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක වැඩිම මිළ**

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තරය | 3 වෙනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේදී සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. නුවරඑළිය නාගරික සහා ප්‍රදේශය<br>2. නානුඔය<br>3. කඳපොල<br>4. රාගල<br>5. උඩපුස්සැල්ලාව<br>6. රම්බොඩ වවුම<br>7. සංගිලිපාලම<br>8. කුඩාඔය<br>9. පුණ්ඩලු ඔය<br>10. තිස්පනේ කෝරළේ<br>11. පල්ලෙපනේ කෝරළේ<br>12. මොරපේ<br>13. විලිකුල්වරි<br>14. ඩයගම<br>15. ආගරපතන<br>16. මැදපනේ ගම්සහා ප්‍රදේශය<br>17. දිඹුල<br>18. වටගොඩ<br>19. තලවකැලේ<br>20. ලිඳුල<br>21. වලහා<br>22. කොටගල | උම්බලකඩ ... | 2 52 |
| 23. අඹේවෙල<br>24. නිල්දණ්ඩාහින්න<br>25. හරස්බැද්ද<br>26. වතුමුල්ල<br>27. කුඹල්ලොලුව | උම්බලකඩ ... | 2 59 |
| 28. රූපහ ... ... ... ... | උම්බලකඩ ... | 2 60 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**1959 අංක 1 දරණ ආහාර මිළ නියෝගය.** අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ).

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

ගාළු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් මෙතියස් ස්ටීවන් ක්ලිටස් ගුණවර්ධන වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන්ද මා හට පැවරී තිබෙන බලතල අනුව–

(1) 1958 අගෝස්තු 23 වැනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 අගෝස්තු 14 වැනි දින අංක 13 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 3 සහ 4 වැනි තීරවල පිළිවෙලින් දක්වෙන තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි මස 1 වැනි දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත 1959 පෙබරවාරි මස 1 වැනි දින සිට මේ උපලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුල උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුල යම් ස්ථානයක හෝ යම් වාහනයක උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ එකී වාහනයේ ප්‍රකටව පෙණෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයෙන් කාර්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, නියම කරමි.

(7) එසේම, උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුල උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග, ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහාදෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උප ලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුලත් වී ඇති බවද නියම කරමි.

ඇම්. ඇස්. සී. ගුණවර්ධන,
සහකාර ආහාර මිළ පාලක තැන,
ගාළු පාලන දිස්ත්‍රික්කය.

1959 ජනවාරි මස 31 වැනි දින පෙරවරු 10 ට ගාල්ලේදී අත්සන් තබන ලදි.

## උප ලේඛනය

| 1 වැනි තීරය<br>පලාත් | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. ගාළු නාගරික සීමාව සහ කඩවත් සතර<br>2. අම්බලන්ගොඩ පලාත් ආණ්ඩු සභාව<br>3. දෙඩන්දූව සුළු නගර සභා සීමාව<br>4. හික්කඩුව සුළු නගර සභා සීමාව<br>5. වකුගෙදර සුළු නගර සභා සීමාව<br>6. බලපිටිය සුළු නගර සභා සීමාව | උම්බලකඩ (සියලුම වර්ගවල) ... | 248 0 ... | 2 48 |
| ගම්කාර්‍ය සභා—<br>අහන්ගම ... ...<br>අක්මීමන ... ...<br>බද්දේගම ... ...<br>බටපොල ... ...<br>බෙන්තොට ... ...<br>බෝපේ ... ...<br>ඇල්පිටිය ... ...<br>හබරාදූව ... ...<br>හික්කඩුව ... ...<br>කොස්ගොඩ ... ...<br>කරන්දෙනිය ... ...<br>කෝද්දගොඩ ... ...<br>කොට්ටව ... ...<br>මාදම්පේ ... ...<br>නාගොඩ ... ...<br>පෝද්දල ... ...<br>රත්ගම ... ...<br>තෙලිකඩ-මාපුවාන ...<br>වැලිවිටිය-දිවිතුරේ ...<br>වැයිහේන ... ...<br>දෙවරගොඩ ... ...<br>වඳුරඹ ... ... | උම්බලකඩ (සියලුම වර්ගවල) ... | 248 0 ... | 2 48 |
| හිනිදුම සහ ඔපාත ගම්කාර්‍ය සීමාවන් ඇතුලත ... | උම්බලකඩ (සියලුම වර්ගවල) ... | 255 0 ... | 2 57 |
| [illegible] ගම්සභා සීමාව තුළ | උම්බලකඩ (සියලුම වර්ගවල) ... | 262 0 | 2 64 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

ඇම. ටී./1/59 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය
(උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ (ආහාර/සහකාර මිළ පාලක නැන්පත් හෙට්ටිගේ දොන් ටියුඩර් බෝදිදස වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි සහ 3 (2) යන කොටස්වලින් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11, 480 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරණ ලද 1958 අගෝස්තු 18 වෙනි දින අංක ඇම. ටී./9/58 දරණ ආහාර මිළ නියෝගයේ 1 වෙනි සහ 2 වෙනි උප ලේඛණ වල 12 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උප ලේඛන වල පිළිවෙලින් සඳහන් තොග වෙළෙඳන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිල ද සිල්ලර වෙළෙන්දකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිල ද, 1959 පෙබරවාරි මස 1 වෙනි දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක් ද මීට යාකර ඇති උප ලේඛන වල 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ වල විකිණිය හැකි වැඩිම මිළ 1959 පෙබරවාරි මස 1 වෙනි දින සිට එම උප ලේඛන වල 2 වෙනි තීරයන්හි සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම, මෙහි උප ලේඛන වල 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ වල උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම උප ලේඛන වල 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ වල යම් ස්ථානයක හෝ වාහනයක මෙම උපලේඛන වල 2 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය සවාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුටම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, නියම කරමි.

(7) එසේම, මෙම උප ලේඛන වල 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ වල උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය ; (බර)

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ සවභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන් ද යන වග, ඇතුළත් කුවිතාන්සියක් දියයුතු බවට නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත්, මෙම උප ලේඛන වල 2 වෙනි තීරවල සඳහන් වැඩිම මිල ගණන් වලට ඇතුළත්ව ඇති බවද, නියම කරමි.

1959 පෙබරවාරි මස 3 වෙනි දින පෙ. ව. 10ට මාතර කච්චේරියේදී අත්සන් කරන ලදි.

එච්. ඩී. ටී. බෝදිදස,
මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළපාලක තැන.

### 1වෙනි උප ලේඛනය

ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2වෙනි තීරය<br>උම්බලකඩ<br>(සියළුම වර්ගවල<br>රු. ශ. |
|---|---|
| මාතර නගර සහා සීමාව ... ... ... ... ... | |
| දෙවිනුවර සුළු නගර සභා සීමාව ... ... ... ... — | |
| දෙවිනුවර ගම්කායඹ සභා සීමාව ... ... ... ... — | |
| කැකනදුර ගම්කායඹ සභා සීමාව ... ... ... ... — | |
| මඩිහ–ගොඩගම ගම්කායඹ සභා සීමාව ... ... ... — | 242 0 |
| මාලිම්බඩ ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| මොලොද්දුව ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| නායිමන–මාකාවිට ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| වැලිගම නගර සභා සීමාව ... ... ... ... — | |
| වැලිගම ගම්කායඹ සභා සීමාව ... ... ... ... — | 241 90 |
| අකුරැස්ස ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| ගොඩපිටිය ගම්කායඹ සභා සීමාව ... ... ... — | 242 25 |
| කඹුරුපිටිය ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| හක්මණ ගම්කායඹ සභා සීමාව ... ... ... ... — | |
| කන්දපිට වලකඩ ගම්කායඹ සභා සීමාව ... ... ... — | 242 45 |
| දික්වැල්ල ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| මොරවක ගම්කායඹ සභා සීමාව ... ... ... — | 242 50 |
| බෙරලපනාතර ගම්කායඹ සභා සීමාව ... ... ... — | |
| දෙනියාය ගම්කායඹ සභා සීමාව ... ... ... ... — | 242 75 |

**සැළකිය යුතුයි.**—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

## 2 වැනි උපලේඛනය

### ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>උම්බලකඩ<br>(සියළුම වර්ගවල)<br>රු. ශ. |
|---|---|
| මාතර නගරසභා සීමාව ... ... ... ... | |
| දෙවිනුවර සුළු නගර සභා සීමාව ... ... ... | |
| දෙවිනුවර ගම්කායයී සභා සීමාව, ... ... ... | |
| කැකනදුර ගම්කායයී සභා සීමාව ... ... ... ... | |
| මඩිහ-ගොඩගම ගම්කායයී සභා සීමාව ... ... ... | |
| මාලිම්බඩ ගම්කායයී සභා සීමාව ... ... ... | |
| මොලොද්දුව ගම්කායයී සභා සීමාව ... ... ... | |
| නායිමන-මාකාවිට ගම්කායයී සභා සීමාව ... ... ... | |
| වැලිගම නගර සභා සීමාව ... ... ... ... | |
| වැලිගම ගම්කායයී සභා සීමාව ... ... ... ... | 2 42 |
| අකුරැස්ස ගම්කායයී සභා සීමාව ... ... ... | |
| ගොඩපිටිය ගම්කායයී සභා සීමාව ... ... ... | |
| කඹුරු පිටිය ගම්කායයී සභා සීමාව ... ... ... | |
| හක්මණ ගම්කායයී සභා සීමාව ... ... ... ... | |
| කන්දපිට වලකඩ ගම්කායයී සභා සීමාව ... ... ... | |
| දික්වැල්ල ගම්කායයී සභා සීමාව ... ... ... | |
| මොරවක ගම්කායයී සභා සීමාව ... ... ... | |
| බෙරලපනාතර ගම්කායයී සභා සීමාව ... ... ... | |
| දෙනියාය ගම්කායයී සභා සීමාව ... ... ... ... | |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ **ගණන්ය.** මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී